# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

## 10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව නොවැම්බර් 1 සතිය

**නිපුණතාව ඃ-** භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම ඃ-** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය, ලක්ෂණ හා ගැටලු පැහැදිලි කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යාප්තියට බලපෑ සාධක ඉදිරිපත් කරයි.
* ව්‍යාප්තිය දැක්විය හැකි කර්මාන්ත ස්ථානගත වීම ශ්‍රී ලංකා ආකෘති සිතියමක ළකුණු කරයි.
* එක් එක් කර්මාන්ත පවත්වා ගෙන යාමේ දී ඇති වන ගැටළු අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.
* එක් එක් කර්මාන්ත ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ අදහස් දක්වයි.
* තෝරාගත් කර්මාන්තවල වත්මන් තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීමක් කරයි.
* ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කර්මාන්තවල වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු ඉදිරිපත් කරයි.

**පාඩම ඃ-** ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය, ගැටලු හා ප්‍රවණතා - සංචාරක කර්මාන්තය හා ශ්‍රී ලංකා ආර්ථිකයේ කර්මාන්තවල වැදගත්කම

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 133 සිට 137 තෙක් හොඳින් කියවන්න. පහත දක්වා ඇති උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරකද පරිශීලනය කර වැඩිදුර අධ්‍යයනය කරන්න.

✓ ඓතිහාසික උරුම, පාරිසරික උරුම, නව නිර්මිත යන ස්පෘශ්‍ය උරුමයන්ගෙන් මෙන්ම ආගන්තුක සත්කාර, කාරුණික බව යනාදී අස්පෘශ්‍ය උරුමයන්ගෙන් ද සපිරි රටක් වූ ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට සංචාරයක කර්මාන්තය සඳහා ආකර්ෂණීය රටකි.

✓ ශ්‍රී ලංකාව පුරාම සංචාරක ආකර්ෂණීය ස්ථාන පැවතියද ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය මගින් ප්‍රධාන සංචාරක කලාප හතක් හඳුනාගෙන ඇත.

✓ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩි දියුණු වීම, රාජ්‍ය හා පෞද්ගලික ආයෝජකයින්ගේ අනුග්‍රහය ලැබීම සංචාරක කර්මාන්තයෙහි ප්‍රවණතා වේ.

✓ ශ්‍රී ලංකා ආර්ථිකයට කර්මාන්ත අංශයෙන් ලැබෙන පිටිවහල දළ දේශීය නිෂ්පාදිතය, සේවා නියුක්තිය හා විදේශ විනිමය ඉපැයීම යන ක්ෂේත්‍ර ඔස්සේ හඳුනාගත හැකිය.

**ක්‍රියාකාරකම**

01. ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය විසින් හඳුන්වාදී ඇති ප්‍රධාන සංචාරක කලාප හත ලංකා සිතියමක ලකුණු කරන්න.
02. ශ්‍රී ලංකා ආර්ථිකයට සංචාරක කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න.
03. සංචාරක කර්මාන්තය ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය | | | |
|---|---|---|---|
| ප්‍රධාන සංචාරක කලාප | ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ | ගැටලු | ප්‍රවණතා |
| | | | |

04. ශ්‍රී ලංකා ආර්ථිකයට කර්මාන්ත අංශයෙන් ලැබෙන පිටිවහල හඳුනාගත හැකි ක්ෂේත්‍ර තුන නම් කරන්න.
05. ඉහත සඳහන් කළ අංශය තුළ වැඩිම දායකත්වයක් ලබා දී ඇති ක්ෂේත්‍රය කුමක්ද?
06. කාර්මික අංශයේ සමස්ත අපනයන ඉපැයීම්වලින් වැඩිම ප්‍රමාණයක් උපයාගන්නා අංශය කුමක්ද? එහි ප්‍රතිශතය දක්වන්න.
07. ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය කෙරෙහි කාර්මික අංශයෙහි දායකත්වය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ඃ-**


- Geological Survey and Mines Bureau, Sri Lanka Minerals Year Book – (2012)
- The National Atlas of  Sri Lanka (2007)
- කාර්ය සමාලෝචනය (2012), කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය.
- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව (2012), ශ්‍රී ලංකා මහ බැංකුව.
- හේරත් ජේ. ඩබ්. (1979), ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත්, භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියෙනේ පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/